# 13 රාධාට ලියුමක්

නිවසේ දී ය,
2019.02.08

වාසනා වේවා !

ආදරණීය රාධා,

ඉතිං කොහොම ද තොරතුරු ? අපි නම් සුවෙන් ඉන්නවා. ඔයාගෙ අලුත් යාළුවෝ හොඳ ද ? අපේ පන්තියේ යාළුවෝ ඔයා ගැන තවමත් මතක් කරනවා.

අපේ අම්මා මට බෝනික්කෙක් ගෙනාවා. මම එයාට 'පිංකි' කියලා නම දැම්මා. ඒත් අපේ මල්ලී බෝනික්කන්ට කැමති නැහැ. එයාට ඕනෑ සෙල්ලම් කාර්. ඒ වුණාට එයා පිංකිගේ ගවුම් මහන්න මට උදවු කරනවා.

ඔයා නිසා මට දැන් දෙමළත් පුළුවන්. තාත්තා කිවුවා අවුරුද්දට ඔයාලාගේ ගෙදර එනවා කියලා. අපි එදාට කෝවිලටත් යමු. අපේ අම්මායි, තාත්තායි, මල්ලීයි කෝවිලට යන්න ආසයි. ඒ දවස උදා වෙන තුරු මම මග බලා ගෙන ඉන්නේ.

ඔබ සැමට ජය වේවා !

ඔබේ හිතාදර,
සවනි



'සවනිගෙන් ලියුමක්.' රාධාගේ මුහුණේ සිනාවක් මතු විය.

'කොහොම ද එයා මගේ ලිපිනය හොයා ගෙන තියෙන්නේ? ආ... අපේ මාමාට කොළඹ දි සවනිගේ තාත්තා හමු වෙලා තිබුණා නේ. එදා මාමාගෙන් ඉල්ලා ගන්න ඇති.

ලියුමක් ලියන හැටි ගුරුතුමී කියලා දුන්න එක කොච්චර හොඳයි ද? විස්මයාදි ලකුණ මම දැන ගත්තෙත් එදා. මමත් උත්තරයක් ලියන්න ඕනෑ'. හොඳ ආශීර්වාදයක් ලියන හැටි අක්කාගෙන් අහගන්න ඕනෑ." රාධා කල්පනා කළා ය.

"කාගෙන් ද දුව ලියුම?"

"සවනිගෙන්. ඒ ගොල්ලො අවුරුද්දට මෙහේ එනවා ලු."

"කොච්චර හොඳයි ද? දුවත් උත්තරයක් ලියන්න."

"ඔව්, මං දැන් ම ලියනවා."

## අවබෝධය

1. පාඩම කියවා ප්‍රශ්නවලට උත්තර දෙන්න.

    i. සවනි ලියුම ලිවුවේ කාට ද?

    ii. ලිපිය ආරම්භයේ දී යෙදූ ආශීර්වාදය කුමක් ද?

    iii. සවනි බෝනික්කාට තැබූ නම කුමක් ද?

    iv. බෝනික්කාට ගවුම් මහන්න උදවු කළේ කවුද?

    v. සවනි දෙමළ ඉගෙන ගෙන ඇත්තේ කාගෙන් ද?

## ක්‍රියාකාරකම 1

1. පෞද්ගලික ලිපියක අඩංගු මූලික අංග මොනවා ද?
2. ඔබ කැමති අයකුට යැවීම සඳහා පෞද්ගලික ලිපියක් ලියන්න. දෙමව්පියන්ගේ හෝ ගුරුවරයාගේ සහාය ඇතිව ලිපිය තැපැල් කරන්න.

## ක්‍රියාකාරකම 2

ගැළපෙන වචන යොදා හිස්තැන් පුරවන්න.

| ස්ත්‍රී ලිංග නාම පද | පුරුෂ ලිංග නාම පද |
|---|---|
| අම්මා | ............................ |
| .............................. | මල්ලී |
| .............................. | මාමා |
| අක්කා | ............................ |
| දුව | ............................ |